**ශ්‍රී ලංකා ක්‍රිකට් - 2016**

**------------------------------------**

ශ්‍රී ලංකා ක්‍රිකට්හි (Sri Lanka Cricket - SLC) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1973 අංක 25 දරන ක්‍රීඩා පනත මගින් සංශෝධිත 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ක්‍රිකට්හි කටයුතු පිළිබඳව මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විධායක කමිටුවේ වගකීම

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ (SLFRS for SMES) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම විධායක කමිටුවේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා ක්‍රිකට්හි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ශ්‍රී ලංකා ක්‍රිකට්හි අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කෙරෙන කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ක්‍රිකට්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMES) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS for SMES)

------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ක්‍රිකට් සතු වත්කම්වල වටිනාකම ගණනය නොකෙරුණු අතර ස්ථාවර වත්කම්වල අයිතමයන් හෝ අයිතම කාණ්ඩය ප්‍රමිතිවලට අනුරූපව නොගැලපුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගන 03 ක් ඉදිකිරීම සහ නවීකරණය කිරීම සඳහා ගෙවා තිබුණු රු.19,046,800 ක අත්තිකාරම් මුදලක්, කිසිදු ගැලපීමක් සිදුනොකර අත්තිකාරම් ගිණුම්වල වර්ෂ 05 කට අධික කාලයක සිට රඳවා තිබුණි.

(ආ) ක්‍රීඩාපිටි කුලියට දීමේ ආපසු ගෙවන තැන්පතු මුදල් රු.1,651,002 ක් නිරවුල් කිරීමට හෝ ගිණුම්වලට ගැලපීම් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස වර්ෂ 10 කට අධික කාලයක සිට දක්වමින් පැවතුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

ස්ථාවර වත්කම් ලේඛනය සහ භෞතික සත්‍යාපන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම්වල පරිපූර්ණභාවය, අයිතිය, පැවැත්ම සහ වටිනාකම් පිළිබඳව සනාථ කර ගැනීමට නොහැකි විය.

**2.2.4 ප්‍රමාණවත් අධිකාරී බලයක් නොමැති ගනුදෙනු**

--------------------------------------------------

SLC විසින් ගාල්ල මහනගර සභාව සමග ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය (Galle International Cricket Stadium - GICS) 1998 අප්‍රේල් 20 සිට 2028 අප්‍රේල් 19 දක්වා වර්ෂ 30 කට කල්බදු ගැනීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණු අතර මෙම ගිවිසුම සෑම වර්ෂ 10 කට වරක්ම අළුත් කළ යුතුය. කෙසේ වුවද, පළමුවර ගිවිසුම අළුත් කිරීම 2007 අප්‍රේල් 19 දිනට යෙදී තිබුණද SLC විසින් GICS වෙත වර්ෂ 08 කට අධික කාලයක් රු.10,315,555 ක මුදලක් කුලී වශයෙන් ගෙවමින් වලංගු ගිවිසුමක්ද නොමැතිව භාවිතා කරමින් පැවතුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට්හි මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 63,962,186 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රු.615,947,765 ක් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 551,985,579 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ජාත්‍යන්තර ක්‍රිකට් ආදායම රු.922,469,968 ක අඩුවීම මෙම පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පිළිබඳව වරින්වර ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන අඩුපාඩු | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) එකිනෙක කළමනාකරණ මට්ටම් සඳහා වෙන වෙනම විධිමත් ජර්නල් සටහන් පරිපාටියක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ස්ථාපිත කර නොතිබුණි.<br>(ii) ගෙවීම් සිදුකිරීමේදී හා අත්තිකාරම් නිරවුල් කිරීමේදී කිසිදු පාලනයක් නොතිබුණි.<br>(iii)ස්ථාවර වත්කම් ගිණුම්කරණය පිළිබඳ කිසිදු පාලනයක් නොමැත. |
| (ආ) තොග කළමනාකරණය | ප්‍රමාණවත් ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණු අතර නිසි භෞතික සත්‍යාපනයක්ද සිදුකර නොතිබුණි. |
| (ඇ) චෙක්පත් මඟින් ගෙවීම් | චෙක්පත් අදාල පාර්ශවයන් වෙත ලබා නොදී අත රඳවා ගැනීම. |